# වෙළෙඳාම හා සංචාරක කර්මාන්තය

## සමස්ත වෙළෙඳ තුලනය

1986 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම තවදුරටත් අයහපත් තත්ත්වයක පැවතිණි. මෙම වර්ෂය තුළ දී මුළු අපනයන වටිනාකම සියයට 21 කින් පහත වැටුණි. කෙසේ වෙතත්, ආනයන වියදම ද සියයට 15 කින් පහත වැටුණු අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 1985 වර්ෂය සමඟ සසඳන කල වෙළෙඳ හිඟය සියයට 3 කින් පහත වැටුණි.

අපනයන අංශයෙහි අසතුටුදායක කාර්ය සාධනයට හේතු වූයේ තේ, රබර්, පොල් සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනයන්හි වටිනාකම තියුණු ලෙස පහත වැටීමයි. බනිජ තෙල් අපනයනයෙන් ලද ආදායම තියුණු ලෙස පහත වැටීම නිසා මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර විය. කාර්මික නිෂ්පාදන බොහොමයකින් ලද අපනයන ඉපැයීම් ඉහළ ගිය ද ඉන් ලද වාසිදායක තත්ත්වය පමණටත් වඩා හිලව් කරමින් කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනයෙන් ලද ආදායම පහත වැටුණි.

තාවකාලික රේගු සංඛ්‍යාවලට අනුව, 1986 වසරේ මුළු ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 51,332 ක් (විගැහි දශ ලක්ෂ 1,560) වූ අතර මුළු අපනයන ආදායම රුපියල් දශ ලක්ෂ 34,092 ක් (විගැහි දශ ලක්ෂ 1,036) විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1986 වසරේ වෙළෙඳ හිඟය රුපියල් දශ ලක්ෂ 17,239 ක් (විගැහි දශ ලක්ෂ 524) විය. මෙය 1985 වසරේ වෙළෙඳ හිඟය වන රුපියල් දශ ලක්ෂ 14,034 (විගැහි දශ ලක්ෂ 508) සමඟ සසඳන කල විගැහි වටිනාකම අනුව සියයට 3 ක වැඩිවීමකි.

කාල පමාවන් සහ සටහන් කිරීමේ දී ඇති විය හැකි අනෙකුත් අතපසුවීම් වෙනුවෙන් රේගු සංඛ්‍යා ගැලපූ කල මුළු ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 54,609 ක් (විගැහි දශ ලක්ෂ 1,660) වූ අතර, අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 34,072 ක් (විගැහි දශ ලක්ෂ 1,036) විය. මේ අනුව, ගලපන ලද වෙළෙඳ හිඟය වන රුපියල් දශ ලක්ෂ 20,537 (විගැහි දශ ලක්ෂ 624) ඉකුත් වසරේ ගලපන ලද වෙළෙඳ හිඟය වන රුපියල් දශ ලක්ෂ 17,843 (විගැහි දශ ලක්ෂ 646) සමඟ සසඳන කල විගැහි වටිනාකම අනුව සියයට 3 කින් සංකෝචනය විය.

### 1 . 28 සංඛ්‍යා සටහන
### වෙළෙඳ තුලනය 1984 – 1986

රුපියල් දශ ලක්ෂ (වරහන් තුළ විගැහි දශ ලක්ෂ)

| වර්ෂය | ආනයන(අ) | | අපනයන(ආ) | | වෙළෙඳ තුලනය | |
|---|---|---|---|---|---|---|
| | රේගු | ගලපන ලද | රේගු | ගලපන ලද | රේගු | ගලපන ලද |
| 1984 .. | 46,913 (1,799) | 47,541 (1,823) | 37,006 (1,419) | 37,347 (1,432) | – 9,908 (– 380) | – 10,194 (– 391) |
| 1985 .. | 49,069 (1,776) | 54,049 (1,956) | 35,035 (1,268) | 36,207 (1,311) | – 14,034 (– 508) | – 17,843 (– 646) |
| 1986(ඇ) .. | 51,332 (1,560) | 54,609 (1,660) | 34,092 (1,036) | 34,072 (1,036) | – 17,239 (– 524) | – 20,537 (– 624) |

(අ) සන රන් හා කාසි ඇතුළත් නොවේ.
(ආ) ප්‍රතිඅපනයන ඇතුළත්ය.
(ඇ) තාවකාලිකයි.

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව,
ලංකා පොහොර සංස්ථාව සහ වෙනත්
ප්‍රධාන පොහොර ආනයනකරුවෝ,
සීමාසහිත එසාර් ලංකා,
ලංකා නැව් සංස්ථාව.

1986 වසරේ දී සියළුම ප්‍රධාන කෘෂිකාර්මික අපනයනයන් සඳහා ලැබූ සාමාන්‍ය මිළ 1985 වසරේ ඒවාට ලැබුණු සාමාන්‍ය මිළ ගණන් හා සසඳන කල පහත වැටුණි. ආනයන අංශයෙහි ලා ඛනිජ තෙල් මිළ සහ ආහාර පාන බොහොමයකම මිළ පහත වැටුණු නමුදු ඉන් ඇති වූ වාසිදායක බලපෑම වෙළෙඳ අනුපාතය අනුක්‍රමික දෙවන වසරේදීත් තවදුරටත් අයහපත් අතට හැරීම වැලැක්වීමට තරම් ප්‍රමාණවත් නොවීය. අපනයන මිළ දර්ශකය අනුව මනිනු ලැබූ කල අපනයන මිළ ගණන් සියයට 11 කින් පහත වැටුණු අතර, ආනයන මිළ දර්ශකය අනුව මනිනු ලැබූ කල ආනයන මිළ ගණන් සියයට 6 කින් පහත වැටුණි. මෙසේ ආනයන හා අපනයන මිළ ගණන්වල සාපේක්ෂ හැසිරීම වෙළෙඳ අනුපාතය තවදුරටත් පහත වැටීමකට තුඩු දුන් අතර, එය වෙළෙඳ අනුපාත දර්ශකය 1985 දී 108 සිට 1986 දී 102 දක්වා සියයට 5 කින් පහත වැටීමෙන් පැහැදිළි විය.

**1 . 29 සංඛ්‍යා සටහන**

**විදේශීය වෙළෙඳාම 1979 – 1986**

| වර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | දර්ශක අංක 1981 = 100 | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | පරිමාව | | මිළ | | වෙළෙඳ අනුපාතය |
| | අපනයන* (නැ.වි.ස.) | ආනයන* (මි.ර.ගැ) | වෙළෙඳ තුලනය | සියළුම අපනයන | සියළුම ආනයන | සියළුම අපනයන | සියළුම ආනයන | |
| 1979 .. | 15,286 | 22,560 | – 7,275 | 89 | 85 | 82 | 76 | 109 |
| 1980 .. | 17,595 | 33,942 | – 16,347 | 95 | 107 | 92 | 90 | 102 |
| 1981 .. | 21,043 | 36,583 | – 15,540 | 100 | 100 | 100 | 100 | 100 |
| 1982 .. | 21,454 | 41,946 | – 20,492 | 105 | 98 | 98 | 107 | 92 |
| 1983 .. | 25,096 | 45,558 | – 20,461 | 99 | 108 | 125 | 110 | 113 |
| 1984 .. | 37,347 | 47,541 | – 10,194 | 116 | 109 | 160 | 119 | 134 |
| 1985 .. | 36,207 | 54,049 | – 17,843 | 120 | 102 | 142 | 132 | 108 |
| 1986 (අ) .. | 34,072 | 54,609 | – 20,537 | 128 | 114 | 126 | 124 | 102 |

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව,
ශ්‍රී ලංකා මහ බැංකුව.

* 1980 සිට ඉදිරියට ගලපන ලද සංඛ්‍යා දක්වේ.
(අ) තාවකාලිකයි.

**අපනයන**

ගලපන ලද සංඛ්‍යාවලට අනුව 1986 වසරේ දී මුළු අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 34,072 ක් (විගැහි දශ ලක්ෂ 1,036) වූ අතර, එය 1985 වසරේ මුළු අපනයන ඉපැයීම් වන රුපියල් දශ ලක්ෂ 36,207 (විගැහි දශ ලක්ෂ 1,311) සමඟ සසඳන කල රුපියල් වටිනාකම අනුව සියයට 6 කින් ද, විගැහි වටිනාකම අනුව සියයට 21 කින් ද පහත වැටුණි. 1986 වසරේ අපනයන අංශයේ මෙම කාර්ය සාධනය 1985 වසරේ පැවති තත්ත්වයට බොහෝදුරට සමාන විය. එනම් එම වසරේ දී 1984 සමඟ සසඳන කල අපනයන ඉපැයීම් රුපියල් වටිනාකම අනුව සියයට 3 කින් ද, විගැහි වටිනාකම අනුව සියයට 8 කින් ද පහත වැටුණි. 1986 දී අපනයන ඉපැයීම් පහත වැටීමට විශාල වශයෙන් හේතු වූයේ කෘෂිකාර්මික නිෂ්පාදනවලින් ලැබූ ඉපැයීම් 1985 පැවති මට්ටම වූ රුපියල් දශ ලක්ෂ 19,026 (විගැහි දශ ලක්ෂ 689) සිට රුපියල් දශ ලක්ෂ

DISCARDED

15,764 (විගැහි දශ ලක්ෂ 479) දක්වා පහත වැටීමයි. ඛනිජ තෙල් අපනයනයෙන් ලද ඉපැයීම් තියුණු ලෙස පහත වැටීම හේතුකොටගෙන කාර්මික නිෂ්පාදන අපනයනයෙන් ලද මුළු ඉපැයීම් ද 1985 වර්ෂයේ වූ විගැහි දශ ලක්ෂ 517 සිට 1986 දී විගැහි දශ ලක්ෂ 483 දක්වා පහත වැටුණි. කෙසේ නමුත්, රුපියල් වටිනාකම අනුව ගත් කල කාර්මික අපනයන මගින් ලද ඉපැයීම් 1985 වසරෙහි රුපියල් දශ ලක්ෂ 14,295 සිට 1986 වසරෙහි දී රුපියල් දශ ලක්ෂ 15,878 ක් දක්වා ඉහළ නැඟුණි. ඛනිජ ද්‍රව්‍ය අපනයනයෙන් ලද ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 1,182 (විගැහි දශ ලක්ෂ 36) ඉකුත් වසර සමඟ සසඳන කල රුපියල් වටිනාකම අනුව සියයට 37 කින් ද, විගැහි වටිනාකම අනුව සියයට 15 කින් ද ඉහළ නැඟුණි. මෙය ඉතා සැළකිය යුතු වර්ධනයක් වුව ද අපනයන ව්‍යුහය තුළ ඛනිජමය අපනයන ඉපැයීම්වල දයකය ඉතා සුළු බැවින් මුළු අපනයන ඉපැයීම් කෙරෙහි ඉන් ඇති වූ වාසිදයක බලපෑම ඉතා අල්ප විය.

1986 වසරේ අපනයන අංශයෙහි ඉතා කනස්සල්ලට පත් කරවන සුළු ලක්ෂණයක් වූයේ කෘෂිකාර්මික අපනයන ඉපැයීම් පහත වැටීමයි. කෘෂි භාණ්ඩ මිළ ජාත්‍යන්තර වෙළෙඳ-පොළෙහි පහත වැටීම මෙයට ප්‍රධාන හේතුව විය. තේ සහ පොල් නිෂ්පාදනවලින් ලද අපනයන ඉපැයීම් රුපියල් වටිනාකම අනුව සියයට 23 ක් බැගින් ද, විගැහි වටිනාකම අනුව සියයට 35 ක් බැගින් ද පහත වැටුණි. රබර් සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිතයන්හි අපනයන ඉපැයීම් රුපියල් වටිනාකම අනුව අනුපිළිවෙලින් සියයට 2 කින් සහ සියයට 10 කින් ඉහළ ගිය ද, විගැහි වටිනාකම අනුව අනුපිළිවෙලින් සියයට 14 කින් සහ සියයට 8 කින් පහත වැටුණි.

තේ අපනයන ඉපැයීම් පහත වැටුණු නමුදු තේ අපනයන පරිමාව ඉකුත් වසරේ කිලෝග්‍රෑම් දශ ලක්ෂ 198.0 සිට 1986 දී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 207.8 ක් දක්වා සියයට 5 කින් ඉහළ නැඟුණි. 1986 තේ අපනයන පරිමාව වසර 11 කට පසු දක්නට ලැබුණු ඉහළම ප්‍රමාණයයි. තේ අපනයන මිළ ගණන්වල පහත වැටීම කෙතරම් තියුණු වූයේ ද යත් මෙසේ ඉහළ ගිය අපනයන පරිමාවෙන් ලද වාසිය ද හිලව් කරමින් මුළු අපනයන ඉපැයීම් ඉකුත් වසරටත් වඩා පහත් මට්ටමකට වැටීමට හේතු සාධක විය. සාමාන්‍ය තේ අපනයන මිළ 1985 වසරෙහි කිලෝග්‍රෑමයකට රු. 60.62 (විගැහි 2.19) සිට 1986 දී කිලෝග්‍රෑමයකට රුපියල් 44.52 (විගැහි 1.35) දක්වා පහත වැටුණි.

1985 වසරේ සිට ලෝක වෙළෙඳපොළෙහි තේ මිළ අනුක්‍රමයෙන් පහත බැසීමක් දක්නට ලැබුණු අතර, එය කොළඹ තේ වෙන්දේසියෙන් ද දක්නට ලැබුණි. මෙසේ කොළඹ තේ වෙන්දේසියෙන් තේ කිලෝග්‍රෑමයකට ලැබුණ සාමාන්‍ය මිළ ශ්‍රී ලංකා මුදලෙහි අගය හීනවීමෙහි ප්‍රතිවිපාකය ද අභිබවමින් 1985 දී කිලෝග්‍රෑමයකට රුපියල් 39.01 සිට 1986 දී කිලෝග්‍රෑමයකට රුපියල් 30.68 දක්වා සියයට 21 කින් අඩු විය. මේ අතර ලන්ඩන් තේ වෙන්දේසියේ දී ශ්‍රී ලංකා තේ කිලෝග්‍රෑමයකට ලැබුණු මිළ පැන්ස 155.65 සිට පැන්ස 115.67 දක්වා සියයට 26 කින් පහත වැටුණි.

රබර් අපනයන පරිමාව 1985 දී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 120 සිට 1986 දී කිලෝග්‍රෑම් දශ ලක්ෂ 110 දක්වා සියයට 8 කින් පහත වැටුණි. රබර් සඳහා ලැබුණු සාමාන්‍ය නැ.වි.ස. මිළ 1985 දී කිලෝග්‍රෑමයකට විගැහි 0.77 සිට 1986 දී කිලෝග්‍රෑමයකට විගැහි 0.72 දක්වා සියයට 6 කින් පහත වැටුණි. කෙසේ නමුත්, රබර් සඳහා ලැබුණු සාමාන්‍ය නැ. වි. ස. මිළ රුපියල් වටිනාකම අනුව 1985 දී කිලෝග්‍රෑමයකට රුපියල් 21.34 සිට 1986 දී කිලෝග්‍රෑමයකට රුපියල් 23.83 දක්වා සියයට 12 කින් ඉහළ නැඟුණි. රබර් අපනයනයෙන් ලද ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 2,566 සිට රුපියල් දශ ලක්ෂ 2,622 දක්වා රුපියල් වටිනාකම අනුව සියයට 2 කින් ඉහළ ගිය නමුදු විගැහි වටිනාකම අනුව 1985 දී විගැහි දශ ලක්ෂ 93 සිට 1986 දී විගැහි දශ ලක්ෂ 80 දක්වා සියයට 14 කින් පහත වැටුණි.

## 1 . 30 සංඛ්‍යා සටහන

### අපනයන සංයුතිය 1984 – 1986

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | | මුළු අපනයනවල ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1984 | 1985 | 1986(ඈ) | 1984 | 1985 | 1986 | 1984 | 1985 | 1986 |
| 1. කෘෂිකාර්මික අපනයන .. | 22,575 | 19,026 | 15,764 | 866 | 689 | 479 | 60·4 | 52·5 | 46·3 |
| 1·1 තේ .. | 15,764 | 12,003 | 9,253 | 605 | 434 | 281 | 42·2 | 33·1 | 27·2 |
| 1·2 රබර් .. | 3,301 | 2,566 | 2,622 | 127 | 93 | 80 | 8·8 | 7·1 | 7·7 |
| 1·3 පොල් .. | 2,118 | 3,093 | 2,389 | 81 | 112 | 73 | 5·7 | 8·5 | 7·0 |
| 1·3·1 පොල් මද නිෂ්පාදිත .. | 1,553 | 2,383 | 1,609 | 60 | 86 | 49 | 4·2 | 6·6 | 4·7 |
| 1·3·2 වෙනත් .. | 566 | 710 | 780 | 22 | 26 | 24 | 1·5 | 2·0 | 2·3 |
| 1·4 සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (අ) (ආ) .. | 1,391 | 1,365 | 1,500 | 53 | 49 | 46 | 3·7 | 3·8 | 4·4 |
| 2. කාර්මික අපනයන (අ) (ආ) .. | 12,918 | 14,295 | 15,878 | 495 | 517 | 483 | 34·6 | 39·5 | 46·6 |
| 2·1 රෙදිපිළි හා ඇඟළුම් .. | 7,566 | 7,960 | 9,629 | 290 | 288 | 293 | 20·3 | 22·0 | 28·3 |
| 2·2 ඛනිජ තෙල් නිෂ්පාදිත .. | 3,288 | 3,877 | 2,358 | 126 | 140 | 72 | 8·8 | 10·7 | 6·9 |
| 2·3 වෙනත් .. | 2,064 | 2,459 | 3,891 | 79 | 89 | 118 | 5·5 | 6·8 | 11·4 |
| 3. ඛනිජමය අපනයන .. | 834 | 864 | 1,182 | 32 | 31 | 36 | 2·2 | 2·4 | 3·5 |
| 3·1 මැණික් .. | 617 | 561 | 755 | 24 | 20 | 23 | 1·6 | 1·6 | 2·2 |
| 3·2 වෙනත් .. | 217 | 303 | 427 | 8 | 11 | 13 | 0·6 | 0·8 | 1·3 |
| 4. වර්ග නොකළ අපනයන (ඇ) .. | 1,020(ඉ) | 2,021(ඉ) | 1,249 | 39 | 73 | 38 | 2·7 | 5·6 | 3·7 |
| මුළු අපනයන (ආ) .. | 37,347 | 36,207 | 34,072 | 1,432 | 1,311 | 1,036 | 100·0 | 100·0 | 100·0 |

(අ) තෝරා ගත් අයිතමයන්.
(ආ) ගලපන ලදී.
(ඇ) ප්‍රතිඅපනයන ඇතුළත්ය.
(ඈ) තාවකාලික.
(ඉ) ගුවන් යානාවක අපනයනය ඇතුළත්ය.

පරිවර්තනතාවය :
1984 විගැහි 1 — රුපියල් 26·08
1985 විගැහි 1 — රුපියල් 27·63
1986 විගැහි 1 — රුපියල් 32·90

මූලයයන් : ශ්‍රී ලංකා රේගුව,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

පොල් නිෂ්පාදන අපනයන ඉපැයීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 3,093 (විගැහි දශ ලක්ෂ 112) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 2,389 (විගැහි දශ ලක්ෂ 73) දක්වා සියයට 23 කින් (විගැහි වටිනාකම අනුව සියයට 35) පහත වැටුණි. පොල් මද නිෂ්පාදන අපනයන ඉපැයීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 2,383 (විගැහි දශ ලක්ෂ 86) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 1,609 (විගැහි දශ ලක්ෂ 49) දක්වා සියයට 32 කින් (විගැහි වටිනාකම අනුව සියයට 43) අඩු විය. මෙම අඩු වීමට මූලික හේතුව වූයේ ප්‍රධාන පොල් මද නිෂ්පාදන එනම් පොල් තෙල්, කොප්පරා සහ කපාපු පොල් සඳහා ලැබුණු නැ. වි. ස. මිළ ගණන් පහත වැටීමයි. මෙම මිළ ගණන් පහත වැටීම පොල් නිෂ්පාදන අපනයන පරිමාවෙහි සියයට 18 ක වැඩි වීමෙන් ලද වාසිය හිලවු කිරීමටත් වඩා ප්‍රමාණවත් විය. අතුරු පොල් නිෂ්පාදිත අපනයනයෙන් ලද ඉපැයීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 710 සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 780 දක්වා සියයට 10 කින් ඉහළ නැගුණි. එසේ නමුදු විගැහි වටිනාකම අනුව මෙම ද්‍රව්‍ය අපනයනයෙන් ලද ආදයම 1985 දී විගැහි දශ ලක්ෂ 26 සිට 1986 දී විගැහි දශ ලක්ෂ 24 දක්වා සියයට 8 කින් අඩු විය.

පොල් අපනයන පරිමාව ගෙඩිවලින් ගණනය කළවිට 1986 දී අපනයනය කරන ලද පරිමාව වූ පොල් ගෙඩි සමක දශ ලක්ෂ 1,105, 1972 න් පසු අපනයනය කරන ලද ඉහළම ප්‍රමාණයයි. 1972 වර්ෂයේ දී පොල් ගෙඩි සමක දශ ලක්ෂ 1,248 ක් අපනයනය කරන ලදී. කෙසේ වෙතත්, පොල් ගෙඩි සමකයකට ලැබුණු සාමාන්‍ය නැ. වි. ස. මිළ වන රුපියල් 1.46 (විගැහි 0.04) 1985 දී පොල් ගෙඩි සමකයකට ලැබූ නැ. වි. ස. මිළ වන රුපියල් 2.54 (විගැහි 0.09) සමඟ සසඳන විට සියයට 43 කින් (විගැහි වටිනාකම අනුව සියයට 56) ඉතා තියුණු ලෙස පහත වැටුණි.

පසුගිය වසර තුනක කාල පරිච්ඡේදය තුළ දී අනුක්‍රමයෙන් හීන වී ගිය සුළු කෘෂිකාර්මික අපනයන ඉපැයීම් 1986 වසරේ දී සියයට 10 කින් වර්ධනය විය. කෙසේ වෙතත්, විගැහි වටිනාකම අනුව සුළු කෘෂිකාර්මික අපනයන ඉපැයීම් සියයට 8 කින් පහත වැටුණි. පලතුරු, කෝපි, කරදමුංගු, තල ඇට, අනෙකුත් තෙල් ලබා ගන්නා ඇට, කොකෝවා, සකස් නොකළ දුම්කොල සහ පැපොල් කිරි විගැහි වටිනාකම අනුව මෙසේ අපනයන ඉපැයීම් පහත වැටුණු භාණ්ඩයන් විය.

කාර්මික අපනයනවලින් ලද අපනයන ඉපැයීම් රුපියල් වටිනාකම අනුව සියයට 11 කින් ඉහළ ගිය නමුදු විගැහි වටිනාකම් අනුව සියයට 7 කින් පහත වැටුණි. කාර්මික අපනයනවලින් ලද මුළු ඉපැයීම් 1986 දී රුපියල් දශ ලක්ෂ 15,878 ක් (විගැහි දශ ලක්ෂ 483) වූ අතර, එය 1985 රුපියල් දශ ලක්ෂ 14,295 (විගැහි දශ ලක්ෂ 517) සමඟ සැසඳිය හැකිය. රෙදිපිළි හා ඇඟළුම් අපනයනයෙන් ලද ඉපැයීම් වන රුපියල් දශ ලක්ෂ 9,629 (විගැහි දශ ලක්ෂ 293) 1985 දී රුපියල් දශ ලක්ෂ 7,960 (විගැහි දශ ලක්ෂ 288) සමඟ සසඳන කල සියයට 21 කින් (විගැහි වටිනාකම අනුව සියයට 2) ඉහළ නැඟුණි.

අනෙකුත් කාර්මික භාණ්ඩ අපනයන ඉපැයීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 2,459 (විගැහි දශ ලක්ෂ 89) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 3,891 (විගැහි දශ ලක්ෂ 118) දක්වා සියයට 58 කින් (විගැහි වටිනාකම අනුව සියයට 33) ඉතා තියුණු ලෙස ඉහළ නැඟුණි. මෙම අපනයන අංශයෙහි ඇති වූ එම දිරි ගන්වන සුළු කාර්ය සාධනය ඉකුත් වසරේ දී රුපියල් දශ ලක්ෂ 313 (විගැහි දශ ලක්ෂ 11) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 1,047 (විගැහි දශ ලක්ෂ 32) දක්වා තුන් ගුණයකින් ඉහළ නැගි දියමන්ති අපනයනයෙහි ප්‍රසාරණය නිසා ඇති වූවකි. කෙසේ වෙතත්, රෙදිපිළි සහ ඇඟළුම් අපනයනයෙන් සහ අනෙකුත් කාර්මික භාණ්ඩ අපනයනයෙන් ලත් ඉහළ ආදයම, ඉතා තියුණු ලෙස පහත වැටුණු ඛනිජ තෙල් අපනයන ඉපැයීම්වල අහිතකර බලපෑම නිසා යටපත් වීම හේතුවෙන් මුළු කාර්මික භාණ්ඩ අපනයනයෙන් ලත් ආදයම පහත වැටුණි. ඛනිජ තෙල් අපනයන ඉපැයීම් 1985 වසරෙහි රුපියල් දශ ලක්ෂ 3,877 (විගැහි දශ ලක්ෂ 140) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 2,358 (විගැහි දශ ලක්ෂ 72) දක්වා සියයට 39 කින් (විගැහි වටිනාකම අනුව සියයට 49) පහත වැටුණි. මෙම පහත වැටීම, මුළුමනින්ම අපනයන මිළ ගණන්වල පහත වැටීම නිසා ඇති වූවකි.

### ආනයන

ගලපන ලද සංඛ්‍යාවලට අනුව, 1986 දී මුළු ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 54,609 ක් (විගැහි දශ ලක්ෂ 1,660) විය. මෙය 1985 වසරේ මුළු ආනයන වියදම වූ රුපියල් දශ ලක්ෂ 54,049[1] (විගැහි දශ ලක්ෂ 1,956) සමග සැසඳිය හැකිය. මේ අනුව 1986 වසරෙහි ආනයන වියදම 1985 ට අදාල සංඛ්‍යා සමග සසඳන කල රුපියල් වටිනාකම අනුව සියයට 1 කින් ඉහළ නැඟුණු නමුදු, විගැහි වටිනාකම අනුව සියයට 15 කින් පහත වැටුණි. මෙම පහත වැටීම අන්තර් භාණ්ඩ ආනයන සහ ආයෝජන භාණ්ඩ ආනයන අංශ මගින් පිළිබිඹු විණි.

ඉකුත් වසර අනුව යමින් 1986 වසරෙහි දී ආනයන සංයුතිය තවදුරටත් වෙනස් විය. මුළු ආනයනවල ප්‍රතිශතයක් ලෙස ගත් කල 1984 වසරෙහි දී සියයට 23 සිට 1985 වසරෙහි දී සියයට 26 දක්වා ඉහළ නැඟුණු පරිභෝජන භාණ්ඩ ආනයන 1986 දී තවදුරටත් සියයට 34 දක්වා ඉහළ නැඟුණි. මෙයට හේතු වූයේ ඉහළ ගිය දේශීය පරිභෝජනය සහ ආරක්ෂණ තොග සඳහා පරිභෝජන භාණ්ඩ මෙම වසර තුළ දී වැඩිපුර ආනයනය කිරීමය. මුළු ආනයනවල ප්‍රතිශතයක් ලෙස ගත්කල අන්තර් භාණ්ඩ ආනයන 1985 දී සියයට 47 සිට 1986 දී සියයට 41 දක්වා පහත වැටුණි. මෙම පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ ඛනිජ තෙල් මිළ පහත වැටීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඛනිජ තෙල් ආනයනය සඳහා වැය කළ ප්‍රමාණය සැළකිය යුතු ලෙස පහත වැටීමයි. ඉකුත් වසර සමග සසඳන කල 1986 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයනයේ දයකත්වය ඉතා ආන්තික වශයෙන් සියයට 19.2 සිට සියයට 19.3 දක්වා ඉහළ නැඟුණි. 1986 වසරේ දී යන්ත්‍රෝපකරණ ආනයන හැර අනෙකුත් සියළු ආයෝජන භාණ්ඩ ආනයන පහත වැටුණි.

1986 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයනය සඳහා වූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 10,556 (විගැහි දශ ලක්ෂ 321) ක් විය. මෙය ඉකුත් වසරේ ඒ සඳහා වැය කළ රුපියල් දශ ලක්ෂ 10,387 (විගැහි දශ ලක්ෂ 376) සමග සසඳන කල රුපියල් වටිනාකම අනුව සියයට 2 ක වැඩි වීමකුත්, විගැහි වටිනාකම අනුව සියයට 15 ක අඩු වීමකුත් පෙන්නුම් කෙරිණි. ප්‍රවාහණ උපකරණ ආනයනය සඳහා වූ මුළු වියදම වන රුපියල් දශ ලක්ෂ 1,457 (විගැහි දශ ලක්ෂ 44) ඉකුත් වසර සමග සසඳන විට සියයට 42 ක (විගැහි වටිනාකම අනුව සියයට 51) පහත බැසීමක් වාර්තා කළේය. විගැහි වටිනාකම අනුව, යන්ත්‍රෝපකරණ ආනයන වියදම සියයට 3 කින් ඉහළ නැඟුණු අතර, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම සියයට 15 කින් පහත වැටුණි.

1986 වසරෙහි දී අන්තර් භාණ්ඩ ආනයන සඳහා වූ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 22,314 ක් (විගැහි දශ ලක්ෂ 678) වූ අතර, එය ඉකුත් වසරෙහි එම භාණ්ඩ ආනයනය සඳහා වැය කරන ලද ප්‍රමාණය වන රුපියල් දශ ලක්ෂ 25,532 (විගැහි දශ ලක්ෂ 924) සමග සසඳන කල සියයට 13 ක (විගැහි වටිනාකම අනුව සියයට 27) පහත වැටීමක් විය. ඛනිජ තෙල්, තිරිඟු ඇට සහ පොහොර වැනි අන්තර් භාණ්ඩ ආනයනය සඳහා වූ වියදම සැළකිය යුතු ලෙස පහත වැටුණි. ඛනිජ තෙල් ආනයන මිළ බැරලයක් විගැහි 28 සිට බැරලයක් විගැහි 13 දක්වා පහත වැටීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඛනිජ තෙල් ආනයනය සඳහා වැය කළ මුදල ඉකුත් වසරෙහි වැය කළ ප්‍රමාණයට වඩා අඩකින් පමණ පහත වැටෙමින් 1986 වසරෙහි දී රුපියල් දශ ලක්ෂ 6,293 (විගැහි දශ ලක්ෂ 191) දක්වා අඩු විය. බොර තෙල් ආනයන පරිමාව ද ඉකුත් වසරෙහි ප්‍රමාණය වූ බැරල් දශ ලක්ෂ 12.2 ක ප්‍රමාණයේ සිට 1986 දී බැරල් දශ ලක්ෂ 12.1 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. තිරිඟු ඇට ආනයන වියදම ද 1985 දී වූ රුපියල් දශ ලක්ෂ 2,765 (විගැහි දශ ලක්ෂ 100) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 2,370 (විගැහි දශ ලක්ෂ 72) දක්වා අඩු විය. එසේ නමුත්, තිරිඟු ඇට ආනයන පරිමාව 1985 දී වූ මෙට්‍රික් ටොන් 6,65,000 සිට 1986 දී මෙට්‍රික් ටොන් 6,81,000 දක්වා ඉහළ නැඟුණි. ඒ අනුව, තිරිඟු ඇට ආනයන වියදමෙහි අඩු වීමට මුළුමනින්ම හේතු වූයේ තිරිඟු ඇට මෙට්‍රික් ටොන් එකක සාමාන්‍ය මිළ 1985 දී විගැහි 150 සිට 1986 දී විගැහි 106 දක්වා පහත බැසීමයි. 1986 තිරිඟු ඇට ආනයනයෙන් සැළකිය යුතු ප්‍රමාණයක් අපනයන

---

1. 1985 වසරට අදල රේගු සංඛ්‍යා රුපියල් දශ ලක්ෂ 1,132 ක් (විගැහි දශ ලක්ෂ 41 ) සඳහා වූ වර්ග නොකරන ලද ආනයන ඇතුලත් කිරීම සඳහා තවදුරටත් ගලපන ලදී. මේ අනුව, ආනයන වියදම වූ රුපියල් දශ ලක්ෂ 53,917 (විගැහි දශ ලක්ෂ 1,915), රුපියල් දශ ලක්ෂ 54,049 (විගැහි දශ ලක්ෂ 1,956) වශයෙන් සංශෝධනය කරන ලදී.

## 1.31 සංඛ්‍යා සටහන

## ආනයනයන්හි අවසන් උපයෝජනය අනුව කෙරෙන වර්ගීකරණය

| කාණ්ඩය | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | | මුළු ආනයනයන්ගේ ප්‍රතිශතයක් වශයෙන් | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1984 | 1985(අ) | 1986(ආ) | 1984 | 1985 | 1986 | 1984 | 1985 | 1986 |
| 1. පාරිභෝගික භාණ්ඩ .. .. .. | 11,052 | 14,261 | 18,609 | 423·8 | 516·2 | 565·6 | 23·2 | 26·4 | 34·1 |
| 1.1 ආහාර සහ පාන වර්ග .. .. | 4,986 | 5,906 | 6,746 | 191·2 | 213·8 | 205·0 | 10·5 | 10·9 | 12·3 |
| 1.1.1 සහල් .. .. .. | 197 | 1,089 | 1,052 | 7·5 | 39·4 | 32·0 | 0·4 | 2·0 | 1·9 |
| 1.1.2 පිටි .. .. .. | 28 | 206 | 90 | 1·1 | 7·5 | 2·7 | 0·1 | 0·4 | 0·2 |
| 1.1.3 සීනි .. .. .. | 1,346 | 1,985 | 1,764 | 51·6 | 71·8 | 53·6 | 2·8 | 3·7 | 3·2 |
| 1.2 රෙදි පිළි හා ඇඟළුම් .. .. | 2,974 | 3,799 | 6,353 | 114·0 | 137·5 | 193·1 | 6·2 | 7·0 | 11·6 |
| 1.3 වෙනත් .. .. .. | 3,092 | 4,556 | 5,510 | 118·6 | 164·9 | 167·5 | 6·5 | 8·4 | 10·1 |
| 2. අන්තර් භාණ්ඩ .. .. .. | 23,749 | 25,532 | 22,314 | 910·7 | 924·2 | 678·3 | 50·0 | 47·2 | 40·9 |
| 2.1 ඛනිජ තෙල් .. .. .. | 10,681 | 10,986 | 6,293 | 409·6 | 397·6 | 191·3 | 22·5 | 20·3 | 11·5 |
| 2.2 පොහොර .. .. .. | 1,103 | 1,579 | 1,282 | 42·3 | 57·2 | 39·0 | 2·3 | 2·9 | 2·4 |
| 2.3 රසායනික ද්‍රව්‍ය .. .. .. | 1,028 | 902 | 1,587 | 39·4 | 32·6 | 48·2 | 2·2 | 1·7 | 2·9 |
| 2.4 තිරිඟු .. .. .. | 2,471 | 2,765 | 2,370 | 94·8 | 100·1 | 72·0 | 5·2 | 5·1 | 4·3 |
| 3. ආයෝජන භාණ්ඩ .. .. .. | 12,170 | 10,387 | 10,556 | 466·7 | 376·0 | 320·9 | 25·6 | 19·2 | 19·3 |
| 3.1 යන්ත්‍ර සූත්‍ර හා උපකරණ .. .. | 5,335 | 4,769 | 5,828 | 204·6 | 172·6 | 177·1 | 11·2 | 8·8 | 10·7 |
| 3.2 ගමනාගමන උපකරණ .. .. | 3,031(ඇ) | 2,499(ඇ) | 1,457 | 116·2 | 90·5 | 44·3 | 6·4 | 4·6 | 2·7 |
| 3.3 ගොඩනැගිලි ද්‍රව්‍ය .. .. .. | 727 | 899 | 907 | 27·9 | 32·5 | 27·6 | 1·5 | 1·7 | 1·7 |
| 4. වර්ග නොකරන ලද .. .. .. | 570 | 3,868 | 3,130 | 21·8 | 140·0 | 95·1 | 1·2 | 7·2 | 5·7 |
| මුළු ආනයන (ඇ) .. | 47,541 | 54,049 | 54,609 | 1,823·0 | 1,956·4 | 1,659·9 | 100·0 | 100·0 | 100·0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) රේගු වාර්තාවල සටහන් නොවූ නැව් සහ ගුවන් යානා වල වටිනාකම් ඇතුළත් වේ.
(ඇ) ගලපන ලදී.

මූලයයන් : ශ්‍රී ලංකා රේගුව,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව,
ලංකා පොහොර සංස්ථාව සහ වෙනත් ප්‍රධාන පොහොර ආනයනකරුවෝ,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
සීමාසහිත එයාර් ලංකා,
ලංකා නැව් සංස්ථාව.

නැංවීමේ වැඩ පිළිවෙළ[1] යටතේ ආනයනය කළ අතර, ඒ සඳහා ගෙවූ සාමාන්‍ය මිළ වන මෙට්‍රික් ටොන් එකකට විගැහි 77 ක ප්‍රමාණය, වෙළෙඳපොළෙහි පැවති මිළ අනුව සසඳන කල ඉතා අඩු එකක් විය.

**1 . 32 සංඛ්‍යා සටහන**

**1986 ප්‍රධාන ආනයනයන්හි පරිමාව**

මෙට්‍රික් ටොන්

| මාසය | | සහල් | තිරිඟු | සීනි | ඛනිජ තෙල් (බොරතෙල්) | පොහොර |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | .. | 39,200 | — | 31,320 | 65,961 | 11,617 |
| පෙබරවාරි | .. | 19,497 | 95,911 | 32,017 | 125,495 | 26,512 |
| මාර්තු | .. | 20,146 | 113,473 | 19,385 | 185,272 | 49,238 |
| අප්‍රේල් | .. | 10,060 | — | 19,328 | 155,242 | 26,257 |
| මැයි | .. | 10,136 | 52,499 | 10,734 | 153,502 | 38,048 |
| ජූනි | .. | 10 021 | — | 12,672 | 152,924 | 39,806 |
| ජූලි | .. | 39,631 | 104,250 | 45,195 | 29,380 | 54,907 |
| අගෝස්තු | .. | 20,349 | 52,500 | 4,950 | 181,555 | 20,481 |
| සැප්තැම්බර් | .. | 20,500 | 66,304 | 15,695 | 152,505 | 24,510 |
| ඔක්තෝබර් | .. | 21,041 | 163,009 | 34,419 | 185,873 | 12,065 |
| නොවැම්බර් | .. | 10,022 | 33,000 | 39,950 | 67,048 | 35,166 |
| දෙසැම්බර් | .. | 10,396 | — | 56,219 | 183,790 | 39,601 |
| එකතුව (අ) | .. | 230,999 | 680,946 | 321,884 | 1,638,547 | 378,208 |

(අ) ගලපන ලදී.

මූලයයන් : ශ්‍රී ලංකා රේගුව,
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
ලංකා පොහොර සංස්ථාව සහ වෙනත් ප්‍රධාන පොහොර ආනයනකරුවෝ,
ශ්‍රී ලංකා මහ බැංකුව.

1986 දී පරිභෝජන භාණ්ඩ ආනයනය සඳහා වැය වූ මුළු වියදම වන රුපියල් දශ ලක්ෂ 18,609 (විගැහි දශ ලක්ෂ 566) ඉකුත් වසර සමඟ සසඳන කල සියයට 30 ක (විගැහි වටිනාකම අනුව සියයට 10) වැඩි වීමක් පෙන්නුම් කෙරිණ. මෙම ඉහළ යාම සියළුම ප්‍රධාන පරිභෝජන භාණ්ඩ වර්ග තුළින් පැහැදිළි විය. විගැහි වටිනාකම අනුව රෙදිපිළි සහ ඇඟළුම් ආනයනය සියයට 40 කින් වැඩි විය. මෙම වැඩිවීම 1985 නොවැම්බර්වල දී රෙදිපිළි ආනයනය ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය. 1986 වසරෙහි දී රෙදිපිළි සහ ඇඟළුම් ආනයනවල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 6,353 ක් (විගැහි දශ ලක්ෂ 193) වූ අතර එය ඉකුත් වසරෙහි මෙම භාණ්ඩ ආනයනය සඳහා වැය කළ රුපියල් දශ ලක්ෂ 3,799 (විගැහි දශ ලක්ෂ 138) සමඟ සැසඳිය හැකිය. වෙනත් පරිභෝජන භාණ්ඩ යටතේ ගැනෙන මෝටර් රථ, මෝටර් සයිකල්, කල් පවත්නා පරිභෝජන භාණ්ඩ, ඖෂධ වර්ග සහ වෙනත් දෑ ආනයනය සඳහා වැය කළ වියදම වන රුපියල් දශ ලක්ෂ 5,510 (විගැහි දශ ලක්ෂ 168) ඉකුත් වසර සමඟ සසඳන කල සියයට 21 ක (විගැහි වටිනාකම අනුව සියයට 2) වැඩි වීමක් පෙන්නුම් කළේය. ආහාර පාන ආනයනය සඳහා වැය කළ වියදම 1985 සමඟ සසඳන කල රුපියල් වටිනාකම අනුව සියයට 14 ක වැඩි වීමක් වාර්තා කළද විගැහි වටිනාකම අනුව එය සියයට 4 කින් අඩු විය.

**විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය**

1977 වසරෙහි හඳුන්වා දෙනු ලැබූ ලිහිල් වෙළෙඳ ප්‍රතිපත්තීන් 1986 වසර තුළදී තවදුරටත් ක්‍රියාත්මක විය. අපනයන වර්ධනය සහ වෙළෙඳාම වැඩිදුර ලිහිල් කිරීම අරමුණු කොටගෙන ඇතැම් සුළු විකරණයන් 1986 වසර තුළ දී හඳුන්වා දෙනු ලැබීය.

1986 වසරේ දී රෙදිපිළි සහ ඇඟළුම් ආනයනය තියුණු ලෙස ඉහළ යාම තුළින් එම අපනයනයන් ලිහිල් කිරීමෙහි බලපෑම මුළුමනින්ම පෙන්නුම් කෙරිණි. දැඩි පාලනයට යටත්ව පැවති රෙදිපිළි සහ ඇඟළුම් ආනයනය 1985 නොවැම්බර් මස දී ලිහිල් කරනු ලැබීය. මෙසේ ලිහිල්

1. අපනයන ඉහළ නැංවීමේ වැඩ පිළිවෙල යනු අපනයන සානු බල ක්‍රමයකි. ඒ අනුව ඇමෙරිකානු තිරිඟු ඇට අපනයනකරුවනට ඇමෙරිකානු එක්සත් ජනපද රජය මගින් සහනාධාරයක් සපයනු ලැබේ.

කිරීමේ දී ආනයනය කරනු ලබන කෘත්‍රිම රෙදි මීටරයක මි. ර. ගැ. වටිනාකම මෙන් සියයට සියයක හෝ රුපියල් 40 ක (මෙම දෙකින් වැඩි එක) ආනයන බද්දක් පනවන ලද අතර, කපු රෙදි සඳහා මි. ර. ගැ. මිළ මෙන් සියයට සියයක් හෝ රුපියල් 25 ක (මෙම දෙකින් වැඩි එක) ආනයන බද්දක් පනවන ලදී.

1986 වසර තුළ දී තිරිඟු ඇට ආනයන මත වූ තීරු බද්ද සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ නංවන ලදී. 1984 දී ජනාධිපති තීරු බදු කොමිසම විසින් කරන ලද නිර්දේශයනට අනුව තිරිඟු ඇට සඳහා වූ ආනයන බද්ද අනුක්‍රමයෙන් සියයට 25 දක්වා ඉහළ නැංවීමෙහි පළමු පියවර ලෙස මෙය දැක්විය හැකිය. ලෝක වෙළෙඳපොළෙහි ඛණිජ තෙල් මිළ ඉහළ යාමෙහි ආරම්භයත් සමග අනුගමනය කළ ජාතික බලශක්ති ප්‍රතිපත්තීනට බාධා ඇති නොවනු පිණිස ඛණිජ තෙල් මිළ පවත්වා ගෙන යාම අරමුණු කරගෙන 1986 මාර්තු මාසයේ දී ඛණිජ තෙල් ආනයන බද්ද සියයට 20 සිට සියයට 45 දක්වා ඉහළ නංවන ලදී. ලෝක ඛනිජ තෙල් මිළ තියුණු ලෙස පහත වැටීමත් සමඟ ඛණිජ තෙල් ආනයන බද්ද සියයට 45 ක් හෝ මෙට්‍රික් ටොන් එකකට රුපියල් 1800 ක (මින් වැඩි එක) නිශ්චිත ප්‍රමාණයක් ලෙස ඛණිජ තෙල් ආනයන බද්දෙහි පදනම 1986 වසරේ අග භාගයේ දී වෙනස් කරන ලදී.

ආනයන පංගු සහ ප්‍රතිකූල බදු ආදී, ආනයනය කරනු ලබන රටවල් මගින් පනවන ලද ඉතා දැඩි වෙළෙඳ සීමාවන් මධ්‍යයේ වුව ද කාර්මික අපනයන අංශය 1986 වසර තුළ දී දිරිගන්වන සුළු කාර්ය සාධනයක් පෙන්නුම් කළේය. ක්‍රමයෙන් වැඩි වන ආරක්ෂනවාදී නැඹුරුවක් ඇ. එ. ජ., කැනඩාව සහ බොහෝ යුරෝපීය රටවල් මගින් ඇඟළුම් හා සම්භාණ්ඩ ආනයන කෙරෙහි දක්වනු ලැබීය. ඇ. එ. ජ., යුරෝපීය ආර්ථික හවුල, කැනඩාව, නෝර්වේ, ස්වීඩනය හා පින්ලන්තය වැනි රටවල රෙදිපිළි හා ඇඟළුම් ආනයන සම්බන්ධයෙන් පංගු සීමා ක්‍රියාත්මක විය. 1986 අග භාගය වනවිට විවිධ රෙදිපිළි සහ ඇඟළුම් වර්ග 25 ක් කෙරෙහි මෙම පංගු සීමා බලපවත්වමින් තිබිණි. කෙසේ වෙතත්, රෙදිපිළි සහ ඇඟළුම් අපනයන සහ අනෙකුත් කාර්මික භාණ්ඩ අපනයනයන්හි ඇති වූ ස්ථිරසාර ප්‍රසාරණය තුළින් පිළිබිඹු වූයේ දේශීය අපනයනයන්ගේ තරගකාරීත්වය සහ අපනයන වැඩි දියුණු කිරීමෙහි සානු බලයන්ගේ සාර්ථකත්වයයි.

1986 වසර තුළ දී තේ, රබර්, පොල් ආදී කෘෂිකාර්මික භාණ්ඩවල මිළ පහත වැටීම, ලෝක වෙළෙඳපොළෙහි පැවති කෘෂිකාර්මික භාණ්ඩ මිළ පහත වැටීමට අනුකූල විය. බෙදුම්වාදී අන්තවාදීන් විසින් ජාත්‍යන්තර වශයෙන් ගෙනයන ලද ව්‍යාජ ප්‍රචාර, විශේෂයෙන් තේවලට විෂ ද්‍රව්‍ය මිශ්‍ර කරන බවට කළ ප්‍රචාර වැනි හේතූන් නිසා මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර විය. කොළඹ තේ වෙන්දේසියේ අලෙවි කළ තේ සඳහා ලැබුණු මිළ ලෝකයේ අනෙකුත් තේ වෙන්දේසිපොලවල ලැබුණු මිළට වඩා අඩු වූ බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. කෙසේ නමුත්, 1986 අග භාගය වනවිට ලෝක වෙළෙඳපොළෙහි තේ සැපයුම පහත වැටීම හේතුකොට ගෙන තේ මිළ ගණන් ස්ථාවර තත්ත්වයකට පත්වනු දක්නට ලැබුණි.

වත්මන් ජාත්‍යන්තර ස්වභාවික රබර් ගිවිසුම 1985 දී වසර දෙකක් සඳහා තවදුරටත් දීර්ඝ කරනු ලදුව 1987 ඔක්තෝබර් මාසයේ දී අවසන් වීමට නියමිතව ඇත. ආරක්ෂණ තොග පවත්වා ගැනීම සම්බන්ධව පාරිභෝගික රටවල් විසින් ඇතැම් වෙනස්කම් කිරීම සඳහා කරන ලද ඉල්ලීම් හේතුවෙන් මෙම ගිවිසුම සම්බන්ධයෙන් අවසාන වශයෙන් 1986 වසරේ ජිනීවාහි පැවති සාකච්ඡා කිසිදු නිගමනයකට නොපැමිණ අවසන් විය. 1986 වසර තුළ දී යෝජිත ජාත්‍යන්තර තේ ගිවිසුමෙහි නිෂ්පාදක රටවල් අතර පංගු වෙන් කිරීම සම්බන්ධ සාකච්ඡා තවදුරටත් පැවැත්විණි.

**අභ්‍යන්තර වෙළෙඳාම**

වඩාත් තරගකාරී පදනමක් යටතේ සාධාරණ ලෙස වෙළෙඳ කටයුතු කරගෙන යාම දිරිමත් කිරීම අභ්‍යන්තර වෙළෙඳ ප්‍රතිපත්තියෙහි අරමුණ විය. භාණ්ඩ හා සේවා පිළිබඳ තොග වෙළෙඳාම, සිල්ලර වෙළෙඳාම හා ඊට අදළ අනෙකුත් කටයුතු සම්බන්ධයෙන් පෞද්ගලික

අංශයේ සහභාගිත්වය දිරිමත් කෙරිණි. රජයේ මැදිහත් වීම අවම මට්ටමෙන් පවත්වාගෙන ගිය අතර එම මැදිහත් වීමෙහි අරමුණ වූයේ තරගකාරිත්වය රැක ගැනීම හා ඒකාධිකාරයන් බිහි වීම වළක්වාලීමයි. යම් තරමක මිළ ස්ථාවරත්වයක් පවත්වා ගැනීම සහ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ප්‍රමාණවත් ලෙස සැපයීමත්, පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමත් කෙරෙහි රාජ්‍ය අංශයේ වෙළෙඳ සංවිධාන මෙහෙයවන ලදී.

ජාතික මිළ කොමිසම විසින් ඉකුත් වර්ෂයේ දී කරනු ලැබූ මිළ විමර්ශනයන් 58 හා සසඳන විට 1986 දී මිළ විමර්ශනයන් 56 ක් මෙහෙයවන ලදී. මෙම මිළ විමර්ශනයන්හි අරමුණ වූයේ මිළ හැසිරවීම නොව, මිළ වෙනස්වීම්වලට හේතු විමසීම මගින් පාරිභෝගික හා නිෂ්පාදක යන දෙපක්ෂයේම අයිතිවාසිකම් රැක දීමයි. 1986 නොවැම්බර් මාසයේ දී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද සාධාරණ වෙළෙඳ කොමිසම පිළිබඳ ව්‍යවස්ථා කෙටුම්පත මගින් ජාතික මිළ කොමිසම වෙනුවට සාධාරණ වෙළෙඳ කොමිසම පිහිටුවීම සඳහා කටයුතු සම්පාදනය කෙරිණි. ජාතික මිළ ප්‍රතිපත්තීන් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීමට අමතරව, ඒකාධිකාරී සංවිධාන, ඒකාබද්ධ සමාගම් සහ තරගකාරිත්වයට එරෙහි බලවේග පිළිබඳව කටයුතු කිරීමට අවශ්‍ය බලතල ද මෙම යෝජිත කොමිසම වෙත පැවරෙනු ඇත.

1986 වර්ෂයේ දී බොහෝ රාජ්‍ය වාණිජ සංවිධාන අඩු පිරිවැටුමක් වාර්තා කළ නමුත්, පෞද්ගලික වෙළෙන්දන්ගෙන් එල්ල වූ තියුණු තරගය හමුවේ සිය වාණිජ පැවැත්ම ශක්තිමත් කර ගැනීමේ අටියෙන් මෙම ආයතන විවිධ වෙළෙඳ කටයුතුවල නිරත විය. රට තුළ පවත්නා ආරක්ෂක තත්ත්වය ගැන සළකා අත්‍යවශ්‍ය වෙළෙඳ ද්‍රව්‍යවල සම්භාරක තොග පවත්වාගෙන යාම සඳහා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට (ස. තො. ස.) බැංකුවලින් වැඩි වැඩියෙන් මූල්‍ය පහසුකම් ලබා දුනි.

විවිධ සේවා සමුපකාර සමිති (වි. සේ. ස. ස.) රට තුළ සංවිධිත සිල්ලර අලෙවි සල් පද්ධතියක් වශයෙන් තවදුරටත් පැවතිනි. කලබලකාරී අවස්ථාවලට මුහුණ දීම සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය කඩිනමින් බෙදා හැරීම අත්‍යවශ්‍ය බවට පත් මැත කාලයේ දී මෙම ආයතනයන්හි වැදගත්කම වඩාත් පැහැදිලි විය. එසේ නැතිවිට, වි. සේ. ස. ස. අලෙවි සල්වල කාර්යයන්, ආහාර මුද්දර ක්‍රමය යටතේ අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීමට පමණක් බොහෝදුරට සීමා විය.

## සංචාරක කර්මාන්තය

1983 වර්ෂයේ සිට සංචාරක කර්මාන්තයෙහි දක්නට ලැබුණු පසුබැස්ම 1986 වර්ෂයේ ද තවදුරටත් දක්නට ලැබුණි. මේ බැව් සංචාරක පැමිණීම්, සංචාරක දින ගණන, කාමර උපයෝගීකරණය සහ ඉපැයීම්වල පහත වැටීම තුළින් පිළිබිඹු විය.

1986 වර්ෂයේ සංචාරක පැමිණීම් ප්‍රමාණය වූ 2,30,106, 1978 වර්ෂයෙන් පසුව වාර්තා වූ අඩුම සංචාරක පැමිණීම් ප්‍රමාණය වන අතර එය 1985 වසර සමඟ සසඳන කල සියයට 11 ක පහත වැටීමක් පෙන්නුම් කළේය. සංචාරක පැමිණීම් උච්ච අවස්ථාවට පත් 1982 මුළු සංචාරක පැමිණීම් ගණන වන 4,07,230 සමඟ සසඳන කල 1986 සංචාරක පැමිණීම් ගණන සියයට 43 කින් පහත වැටුණි. සංචාරක පැමිණීම්වල මෙම අනුක්‍රමික පහත වැටීමට ප්‍රධාන සාධකය වූයේ ශ්‍රී ලංකාවෙහි ආරක්ෂක තත්ත්වය පිළිබඳව විදේශ රටවල පැතිර ගිය අහිතකර ප්‍රචාරයන්ය.

සංචාරක පැමිණීම්වල පහත වැටීම සෑම කලාපයකම දක්නට ලැබුණි. අතීතයේ මෙන් ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණෙන ප්‍රධාන කලාපය වූයේ බටහිර යුරෝපයයි. මෙම කලාපයෙන් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 62 ක් වූ අතර, ඉකුත් වසරේ මෙම කලාපයෙන් පැමිණි සංචාරකයින්ගේ ගණන සමඟ සසඳන කල

1986 දී පැමිණි ප්‍රමාණය සියයට 7 කින් අඩු විය. මෙසේ ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණෙන ප්‍රධාන කලාපයේ සිට පැමිණීම් සියයට 7 කින් පහත බැසීම වර්ෂයෙහි මුළු සංචාරක පැමිණීම් ප්‍රමාණය තියුණු ලෙස පහත වැටීමට බොහෝ සෙයින් හේතු විය. 1984 වසරෙහි දී ඉන්දීය රජය විසින් ශ්‍රී ලංකාවෙහි සංචාරය කොට එරටට ආපසු පැමිණෙන එරට පුරවැසියනට දෙන ලද, බද්දෙන් නිදහස් දීමනාව සීමා කිරීම නිසා ඉන්දීය සංචාරකයින්ගේ පැමිණීම 1986 දී තවදුරටත් පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආසියානු කලාපයෙන් පැමිණි සංචාරකයින්ගේ ගණන 1986 වසරේ දී සියයට 16 කින් පහත වැටුණි. මෙපමණක් නොව උතුරු ඇමෙරිකාව, ඔස්ට්‍රලේෂියාව සහ නැගෙනහිර යුරෝපය වැනි අනෙකුත් ප්‍රධාන කලාපවලින් පැමිණි සංචාරකයින්ගේ ගණන අනුපිළිවෙලින් සියයට 11, සියයට 28 සහ සියයට 10 බැගින් ඉකුත් වසර සමඟ සසඳන කල පහත වැටුණි.

**1.33 සංඛ්‍යා සටහන**

**සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යා ලේඛන 1985 - 1986**

| ශීර්ෂය | 1985 | 1984 ට වඩා ප්‍රතිශත වෙනස | 1986 | 1985 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| 1. සංචාරක පැමිණීම .. | 257,456 | – 18·9 | 230,106 | – 10·6 |
| 2. පැය 24 ට අඩු කාලයකට රට තුළ රැඳෙන විදේශික මගීන්ගේ පැමිණීම .. | 9,882 | 14·9 | 6,266 | – 36·6 |
| 3. සංචාරක දින (රාත්‍රි) ගණන (දහස්) .. | 2,365 | – 15·9 | 2,437 | 3·0 |
| 4. සංචාරකයින්ගෙන් දළ ලැබීම් | | | | |
| 4·1 රුපියල් දශ ලක්ෂ .. | 2,007 | – 24·8 | 2,000(අ) | – 0·4 |
| 4·2 එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ .. | 74·0 | – 29·4 | 71·4 | – 3·5 |
| 4·3 විගැහි දශ ලක්ෂ .. | 72·6 | – 29·1 | 60·8 | – 16·2 |
| 5. පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින්ගේ ගණන | | | | |
| 5·1 විනෝදය .. | 234,038 | – 22·0 | 216,148 | – 7·6 |
| 5·2 ව්‍යාපාරික කටයුතු .. | 18,214 | 66·5 | 10,084 | – 44·6 |
| 6. කලාප අනුව පැමිණි ගණන | | | | |
| 6·1 බටහිර යුරෝපය .. | 153,004 | – 19·8 | 143,022 | – 6·5 |
| 6·2 ආසියාව .. | 79,056 | – 12·3 | 66,150 | – 16·3 |
| 6·3 උතුරු ඇමෙරිකාව .. | 10,358 | – 27·2 | 9,232 | – 10·9 |
| 7. මුළු සේවා නියුක්තිය .. | 54,533 | – 7·4 | 48,000 | – 11·9 |
| 7·1 සෘජු .. | 22,723 | – 7·4 | 20,000 | – 11·9 |
| 7·2 වක්‍ර .. | 31,810 | – 7·4 | 28,000 | – 11·9 |

(අ) තාවකාලිකයි. මූලය : ලංකා සංචාරක මණ්ඩලය.

ලංකා සංචාරක මණ්ඩලය විසින් කරන ලද දළ ඇස්තමේන්තුවකට අනුව 1986 වසරෙහි සංචාරක කර්මාන්තයෙන් ලද මුළු ඉපැයීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,000 ක් (විගැහි දශ ලක්ෂ 61) විය. 1986 වසරේ මෙම ඉපැයීම් ප්‍රමාණය 1980 වසරින් පසුව වාර්තා වූ අඩුම ඉපැයීම් ප්‍රමාණය ලෙස සඳහන් කළ හැකිය. ඉකුත් වසර සමඟ සසඳන කල 1986 වසරෙහි සංචාරක ඉපැයීම් ප්‍රමාණය රුපියල් වටිනාකම අනුව ඉතා සුළු වශයෙන් (සියයට 0.4) පහත වැටුණු නමුදු විගැහි වටිනාකම අනුව සියයට 16 කින් පහත වැටුණි. සංචාරක ඉපැයීම් උච්චාවස්ථාවට පැමිණි 1982 වසරෙහි සංචාරක ඉපැයීම් ප්‍රමාණය වන විගැහි දශ ලක්ෂ 133 සමඟ සසඳන කල 1986 වසරේ ඉපැයීම් ප්‍රමාණය සියයට 54 කින් පහත වැටුණි.

ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන අභිලාෂය විනෝදාස්වාදය වශයෙන් තවදුරටත් පැවති අතර, එම අරමුණ ඇතිව පැමිණි සංචාරකයින්ගේ ප්‍රමාණය මුළු සංචාරකයින්ගේ ප්‍රමාණයෙන් සියයට 94 ක් විය. ඉකුත් වසර සමඟ සසඳන කල ව්‍යාපාරික කටයුතු සඳහා පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව සියයට 45 කින් පහත වැටුණු අතර සාමාජික, ආගමික,

සංස්කෘතික සහ අධ්‍යාපනික අරමුණු ඇතිව පැමිණි සංචාරකයින්ගේ ප්‍රමාණය සියයට 26 කින් පහත වැටුණි. දිනකට වඩා අඩු කාලයක් දිවයිනේ ගත කළ තාවකාලික ආගන්තුකයන්ගේ සංඛ්‍යාව ද ඉකුත් වසර සමඟ සසඳන කල සියයට 37 කින් පහත වැටුණි.

පසු කාලවල දී මෙන් 1986 වසරෙහි දී ද සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන මාධ්‍ය වූයේ ගුවන් මගින් පැමිණීමයි. මෙසේ ගුවනින් පැමිණි මුළු සංචාරකයින් සංඛ්‍යාවෙන් සියයට 80 ක් ලේඛනගත කලාපීය සහ අන්තර් කලාපීය ගුවන් යානා මගින් පැමිණි අතර ඉතිරි සියයට 20 පැමිණියේ කුලී ගුවන් යානාවලිනි. තලෙයිමන්නාරම තොටුපල බෝට්ටු සේවාව තාවකාලිකව වසා තිබීම නිසා මුහුදු මගින් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව ඉතා අල්ප විය.

සංචාරක ව්‍යාපාරය මගින් සැපයුණු සේවා නියුක්ති අවස්ථාවන් 1986 වසර තුළ දී තවදුරටත් පහත වැටුණි. සංචාරක අංශය තුළ සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව ඉකුත් වසරෙහි 54,533 සිට 1986 වසරෙහි දී 48,000 දක්වා සියයට 12 කින් පහත වැටුණු බවට ලංකා සංචාරක මණ්ඩලය විසින් ඇස්තමේන්තු කර ඇත. 1986 වසර තුළ සංචාරක අංශයෙහි සේවා නියුක්තිකයින්ගෙන් 20,000 ක් පමණ ඍජු සේවාවන්හි ද, 28,000 ක් පමණ සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත සේවාවන්හි ද නියුක්තව සිටි බවට ඇස්තමේන්තු කර ඇත.

1986 වර්ෂය තුළ දී ශ්‍රේණිගත නවාතැන් අංශයෙහි ධාරිතාව ඉකුත් වර්ෂයෙහි තිබූ ඒකක 143 සිට ඒකක 127 දක්වා පහත වැටුණි. මෙසේ ශ්‍රේණිගත නවාතැන් අංශයෙහි සියයට 16 ක පහත වැටීමට ප්‍රධාන හේතුව වූයේ නැගෙනහිර වෙරළ ප්‍රදේශයේ තිබූ සංචාරක හෝටල 13 න් 12 ක්ම වසා දැමීමයි. සංචාරක හෝටල්වල ධාරිතා උපයෝගීකරණය අභිමත මට්ටම්වලට වඩා ඉතා පහත් මට්ටමක පැවතින. කෙසේ වෙතත්, ශ්‍රේණිගත සංචාරක හෝටල්වල ධාරිතා උපයෝගීකරණය 1985 වසරෙහි සියයට 32.7 සිට 1986 දී සියයට 33.1 දක්වා ඉතා සුළු වශයෙන් වැඩි විය. මෙය කාමර උපයෝගීකරණයෙහි ඇති වූ වැඩි දියුණුවක් නිසා ඇති වූවක් නොව හුදෙක් සංචාරක හෝටල් වසා දැමීම නිසා කාමර සංඛ්‍යාවේ අඩු වීම නිසා ඇති වූ ප්‍රතිඵලයකි.

උතුරු සහ නැගෙනහිර වෙරළ ආශ්‍රිත සංචාරක හෝටල්වල කිසිදු උපයෝගීකරණයක් නොතිබුණු අතර, පෞරාණික නගර කලාපයෙහි ඉතා අඩු උපයෝගීකරණ මට්ටමක් පැවතින. කෙසේ නමුත් කොළඹ නගරය, මහ කොළඹ සහ දකුණු වෙරළ ආශ්‍රිත කලාපයන්හි මධ්‍යස්ථ උපයෝගීකරණ අනුපාතයන් පැවතිණි.

1983 සිට හෝටල් අංශයට වීටින් විට රජය මගින් සලසන ලද සහන වැඩපිළිවෙල 1986 වසරේ දී තවදුරටත් ක්‍රියාත්මක විය. සංචාරක හෝටල්වලට සපයන ලද මෙම සහන වැඩ පිළිවෙලට අයත් ඇ අතර බැංකු ණය ප්‍රතිලේඛනගත කිරීම ද අඩංගු විය. මුල දී වසර දෙකකට පමණක් සලසන ලද ණය ගෙවීම කල් තැබීමේ පහසුකම 1987 දී අවසන් වීමට නියමිතව තිබූ නමුදු සංචාරක කටයුතුවල දිගින් දිගටම පවත්නා පහත වැටීම සැළකිල්ලට ගනිමින් 1989 මාර්තු මාසය දක්වා තවදුරටත් දීර්ඝ කරන ලදී. මෙම දීර්ඝ කිරීමේ දී කලින් සලසා තිබූ සියයට 80 වේ ණය ප්‍රතිලේඛනගත කිරීම සියයට 100 දක්වා ඉහළ දමන ලදී. අහිතකර බලපෑමට පාත්‍ර වූ හෝටල් සඳහා රජය මගින් පොළී රහිත ණය පහසුකමක් ද සලසන ලදී.